# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2016

2022 නොවැම්බර් - 2023 ජනවාරි

**මානවශාස්ත්‍ර පීඨය**

**ප්‍රතිබිම්බ කලා** (නව/පැරණි නිර්දේශය)

**සිනමා හා රූපවාහිනී රසාස්වාදය IMAT – E 3025**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. අනෙකුත් කලා මාධ්‍යයන් හා සසඳමින් චිත්‍රපටය සුවිශේෂී කලා මාධ්‍යයක් වන්නේ කෙසේදැයි විස්තර කරන්න.

02. විචාරකයා යනු කලාත්මක සිනමාවේ ප්‍රගමණයට අත්‍යාවශ්‍ය පුද්ගලයෙක් දැයි විමසීමක යෙදෙන්න.

03. රසිකයෙකු විසින් චිත්‍රපට නැරඹීමට හා ප්‍රතික්ෂේප කිරීමට හේතුවන කරුණු මොනවාදැයි සාකච්ඡා කරන්න.

04. මෑතකදී ඔබ නැරඹූ චිත්‍රපට නිර්මාණයක් තෝරාගෙන ඒ පිළිබඳ සිනමාත්මක රසාස්වාදයක යෙදෙන්න.

05. "අන්තර්ජාලය මත පදනම් නව මාධ්‍ය භාවිතයත් සමඟ රූපවාහිනී වෙළඳ දැන්වීමක අගය හීනවී ඇතැයි ඔබේ මිතුරෙකු පවසයි." ඉහත කියමන හා ඔබ එකඟවන්නේ දැයි විමසීමක් කරන්න.

06. රූපවාහිනී මාධ්‍යයේ විකාශනය වන ටෙලිනාට්‍ය සුදුසු වර්ගීකරණයක් පදනම් කොට විග්‍රහ කරන්න.

07. "ඒකාංක ටෙලිනාට්‍ය" යනු රූපවාහිනී ටෙලිනාට්‍ය අතර කලාත්මක ටෙලිනාට්‍ය ප්‍රවර්ගයකි යැයි පැවසෙන මතය, ඒකාංක ටෙලිනාට්‍යයේ විශේෂතා කෙරෙහි අවධානය යොමු කරමින් විමසීමකට ලක්කරන්න.

08. රූපවාහිනී මාධ්‍යයෙන් විකාශනය වූ වාර්තා වැඩසටහනක් තෝරාගෙන ඒ පිළිබඳ ඇගයීමක් කරන්න.

*****************************